ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
කර්මාන්ත අමාත්‍යාංශය

**තනතුරු පුරප්පාඩු**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රීලාංකික පුරවැසියන් අතුරින් සුදුසුකම්ලත් හා අත්දැකීම් සහිත අපේක්ෂකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. අධ්‍යක්ෂ ජනරාල් තනතුර

**සුදුසුකම් හා පළපුරුද්ද:**

*බාහිර*

අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් වෙතින් අලෙවි කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය/ මානව සම්පත් කළමනාකරණය/ වාණිජ්‍යය/ ආර්ථික විද්‍යාව/ විද්‍යාව (රසායන විද්‍යාව විෂයක් වශයෙන් ඇතුලත් ) ප්‍රථම උපාධියක්

**සහ**

අලෙවි කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය/ මානව සම්පත් කළමනාකරණය/ වාණිජ්‍යය/ ආර්ථික විද්‍යාව/ රසායන විද්‍යාව/ රත්න විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබිම.

අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් වෘත්තියවේදි ආයතනයක සංයුක්ත සමාජිකත්වයක් ලබා ගෙන ඇති අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛත්වය ලැබෙනු ඇත.

ආ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමෙහි වර්ෂ 06ක් ද ඇතුලුව කළමනාකරණ මට්ටමෙහි වසර 20 ක අවම පළපුරුද්දක් ලබා තිබිම.

**සහ**

ඇ) විනය මෙහෙයවීම, මගපෙන්වීමේ කාර්යය හා මානව සම්පත ඇතුළු අනෙකුත් සම්පත් ඵලදායි ලෙස හා කාර්යක්ෂමව කළමණාකරණය කිරිමේ හැකියාවෙන් යුතු වීම.

ඇ) ඉංග්‍රිසි මාධ්‍යයෙන් වැඩ කිරිමට හැකිවිම අත්‍යාවශ්‍යය.

*වැටුප් පරිමාණය*

HM 2.1 – Rs. [91,645 - 2700x12-124045/-] + රජයේ අනුමත දීමනා වේ.

**අතිරේක ප්‍රතිලාභ**

- PED චක්‍රලේඛ අංක 01/2015 යටතේ නිල ප්‍රවාහන පහසුකම් ලබාදෙනු ඇත.

**වයස :**

අවුරුදු 40ට නොඅඩු සහ 55 නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස බලනොපායි.

## 2. අධ්‍යක්ෂ (අපනයන සේවා සහ අපනයන අලෙවි) - (HM 1-1) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන් - සුදුසුකම් හා පළපුරුද්ද**

a) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවි කළමනාකරණ / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය / ජාත්‍යන්තර ව්‍යාපාර / ජාත්‍යන්තර වෙළඳාම / වාණිජ / ආර්ථික විද්‍යාව /උපාය මාර්ගික කළමනාකරණය / විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය

**සමඟ**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් අලෙවි කළමනාකරණය / රත්න විද්‍යාව / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය / වාණිජ්‍ය / ආර්ථික විද්‍යාව / ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ පශ්චාත් උපාධිය

**සමඟ**

රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

b) ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (SLIM) හෝ වරලත් අලෙවි කරණ ආයතනයේ (CIM) හෝ ඒ හා සමාන පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක පූර්ණ සාමාජිකත්වය

**සමග**

රාජ්‍ය සංස්ථාවක,මණ්ඩලයක,ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස -:**

වයස අවුරුදු 35 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර) . අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බලපානු නොලැබේ.

## 3. අධ්‍යක්ෂ (තක්සේරු / රත්න විද්‍යාඥ) - (HM 1-1) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන් - සුදුසුකම් හා පළපුරුද්ද**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාව (රසායන විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා තිබිය යුතුයි) / ඛණිජ විද්‍යාව / රත්න විද්‍යාව / භූ විද්‍යාව / භූ සම්පත් කැණීම් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ප්‍රථම උපධිය ලබා තිබීම සහ රසායන විද්‍යාව / ඛණිජ විද්‍යාව / රත්න විද්‍යාව / භූ විද්‍යාව / භූ සම්පත් කැණීම් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව පිළිබඳ පශ්චාත් උපාධිය ලබා තිබීම හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Corporate Membership) සමඟ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු කළමනාකරණ මට්ටමේ වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

## 4. අධ්‍යක්ෂ (රන් ප්‍රමාණය නිශ්චය කිරීම හා මුද්‍රා තැබීම) - (HM 1-1) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන් - සුදුසුකම් හා පළපුරුද්ද**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව / භූ සම්පත් කැණීම් ඉංජිනේරු විද්‍යාව / රත්න විද්‍යාව / භූ විද්‍යාව / ඛණිජ විද්‍යා / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය / අලෙවි කළමනාකරණ ප්‍රථම උපධිය ලබා තිබීම සහ රසායන විද්‍යාව / භූ සම්පත් කැණීම් ඉංජිනේරු විද්‍යාව / රත්න විද්‍යාව / භූ විද්‍යාව / ඛණිජ විද්‍යා / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය / අලෙවි කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධිය ලබා තිබීම සමඟ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු කළමනාකරණ මට්ටමේ වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

**වයස - තනතුරු අංක 03 සහ 04 සඳහා :**

වයස අවුරුදු 35 ට නොඅඩු හා 50 ට නොවැඩි විය යුතුය (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර) . අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය - තනතුරු අංක 02, 03 සහ 04 සඳහා:**

HM 1-1 Rs 80,295 - 2,270 x 15 - 114,345 + රජයේ අනුමත දීමනා හිමි වේ.

## 5. ප්‍රසම්පාදන නිලධාරී - (JM 1-1) – තනතුරු 01

**බාහිර අයදුම්කරුවන් - සුදුසුකම් හා පළපුරුද්ද**

a) ගණකාධිකරණය / කළමනාකරණය / වාණිජ්‍ය / ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (ICASL) හෝ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA) හෝ සහතිකලත් සහ සංයුක්ත ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙහි (ACCA) අන්තර් මාධ්‍ය විභාගය සමත්ව තිබීම / ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම සමඟ සුදුසුකම් සැපිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

b) පළමු හෝ දෙවන පෙළ පන්ති සාමාර්ථයක් ලබා ඇති සහ ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනයෙහි (NIBM) මූල්‍ය සහ කළමනාකරණ ගණකාධිකරණය හෝ සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය පිලිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර තිබීම හෝ ශ්‍රී ලංකා ගණකාධිකාරණ ශිල්පීයන්ගේ සංගමයෙහි (AATSL) පූර්ණ සුදුසුකම ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය හිමි වේ.

c) ඉංග්‍රිසි මාධ්‍යයෙන් වැඩ කිරිමට හැකිවීම අත්‍යාවශ්‍යයි.

<u>**වැටුප් පරිමාණය -:**</u>

JM 1-1 – (Rs. 42,600 – 755x10 -1135x18-70,580/-) + රජයේ අනුමත දීමනා හිමි වේ.

## 6. තක්සේරු රත්නවිද්‍යාඥ සහකාර - (MA 5-1) – තනතුරු 02

**බාහිර අයදුම්කරුවන් - සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක රත්න විද්‍යාව/ භූ විද්‍යාව/ ඛණිජ විද්‍යාව/ ඛණිජ තාක්ෂණ විද්‍යාව/ පරිසර විද්‍යාව සහ ස්වභාවික සම්පත් කළමනාකරණය/ විද්‍යාව (ඛණිජ විද්‍යාව/ රසායන විද්‍යාව/ භූ විද්‍යාව/ භෞතික විද්‍යාව විෂයක් වශයෙන් ඇතුලත්) උපාධියක් ලබා තිබීම.

<u>**වයස -: තනතුරු අංක 05 සහ 06 සඳහා:**</u>

වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර) . අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බලපානු නොලැබේ.

<u>**වැටුප් පරිමාණය**</u>

MA 5.1 - Rs. [34,870 – 10x660- 15x755-11x930-63,025/-] + රජයේ අනුමත දීමනා හිමි වේ.

<u>**අතිරේක ප්‍රතිලාභ;**</u>

- සේවක අර්ථසාධක / භාරකාරත්ව අරමුදලේ ප්‍රතිලාභ
- වාර්ෂික ලාභ මත ගෙවනු ලබන දිරි දීමනා
- සේවකයා සහ ඔහු / ඇයගේ පවුලේ අය සඳහා වෛද්‍ය පහසුකම්
- ප්‍රවාහන දීමනා
- ත්‍යාග දීමනා
- නිවාස ණය පොලී සහ වෙනත් ණය පහසුකම්

❖ ඉහත සියලු තනතුරු සඳහා අයදුම් කරන පුරවැසියන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමට බැදි සිටිය යුතුයි.

ඉහත තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන අයදුම්කරුවන් තම අයදුම්පත් ඔබ ගැන විස්තර ලබාගත හැකි ඥාති නොවන දෙදෙනෙකුගේ නම්, තනතුරු හා දුරකථන අංක අයදුම්පත්‍රයට ඇතුලත් කොට තම වෘත්තීය සහ අධ්‍යාපන සහතික සහ සේවා සහතිකවල, සහතික කරන ලද පිටපත්ද සමඟ සිය අයදුම්පත **2022/11/26** දින හෝ එදිනට පෙර අයදුම්කරනු ලබන තනතුරේ නම ලියුම් කවරයේ ඉහල වම් කෙලවරෙහි සඳහන් කර **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි** වෙත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවය කරන අපේක්ෂකයින් සිය අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානින් මගින් එවිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. **මෙම දැන්වීම් 2022/11/12 දින සිට www.ngja.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ප්‍රසිද්ධියට පත්කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.**


**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි**

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**

**අංක 12. මැක්සන්ස් ටවර්, ඇල්ෆ්‍රඩ් හවුස් ගාර්ඩන්, කොළඹ 03**

**දුරකථන : 011-2329295/2325364/2390645-8 ෆැක්ස් : 011-2320758**

**වෙබ් අඩවිය : www.ngja.gov.lk**